# දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය ආශ්‍රිත පුද සිරිත් සහ සමාජය

ජනක චමින්ද කෝට්ටගොඩ

දර්ශනසූරි 2019

# දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය ආශ්‍රිත පුද සිරිත් සහ සමාජය

**ජනක චමින්ද කෝට්ටගොඩ**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සංස්කෘතික අධ්‍යයනය දර්ශනසූරි

උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධය

## පර්යේෂක ප්‍රකාශය

මෙම නිබන්ධයට ඇතුළත් කර ඇති "**දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය ආශ්‍රිත පුද සිරිත් සහ සමාජය**" නම් වූ ස්වාධීන පර්යේෂණ කාර්යය උපදේශකවරුන්ගේ උපදේශකත්වය යටතේ සිදු කරන ලදි.

මෙම පර්යේෂණයට අදාළ කිසිදු වාර්තාවක් පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් හෝ වෙනත් උපාධියක් / ඩිප්ලෝමාවක් සඳහා කිසිදු විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යයන ආයතනයකට හෝ ඉදිරිපත් කර නොමැති බවත් මවිසින් පුස්තකාලයීය අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයන මඟින් දත්ත රැස් කිරීමෙන් ස්වෝත්සාහයෙන් ම සිදු කරන ලද ස්වාධීන පර්යේෂණයක් බවත් මෙයින් සහතික කොට ප්‍රකාශ කර සිටිමි.

අත්සන : ------------------------ දිනය : -----------------

නම : ජනක චමින්ද කෝට්ටගොඩ

1302HU2014001

## උපදේශකවරයාගේ ප්‍රකාශය

ජනක චමින්ද කෝට්ටගොඩ (1302HU2014001) නම් වන දර්ශනසූරි උපාධි අපේක්ෂකයා විසින් කරනු ලැබ ඇති ප්‍රකාශය සත්‍ය බවත් අපගේ උපදේශකත්වය යටතේ සිදු කළ මෙම දර්ශනසූරි පර්යේෂණ උපාධි නිබන්ධය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු ලෙස සකසා ඇති බවත් සහතික කරමු.

(1) උපදේශකවරයාගේ නම : ආචාර්ය ඩබ්ලිව්. බී. ඒ. විතාරණ මයා

අත්සන : .......................................

දිනය : .......................................

## උපකාරානුස්මෘතිය

අප විසින් "දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය ආශ්‍රිත පුද සිරිත් සහ සමාජය" නමැති මෙම පශ්චාද් උපාධි පර්යේෂණය සම්පාදනය කිරීමේ දී නන් අයුරින් උදවු උපකාර කළ අය බොහෝ ය. ඔවුන් සියල්ලන් කෘතවේදී ව සිහිපත් කැරෙන අතර ඉන් කිහිප දෙනකු මෙහිලා සඳහන් කිරීම අප සතු යුතුකමක් ලෙස සලකමු.

මෙවැනි පර්යේෂණයක අවශ්‍යතාව පසක් කරදෙමින් මතු නොව, නිරතුරුව දිරි ගන්වමින් අප නැණ පහන ආලෝකවත් කරවීමට කටයුතු කරන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති විශ්‍රාමික මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ අප පියාණන් සිහිපත් කරනුයේ ගෞරවාන්විත භක්ත්‍යාදරයෙනි. එමෙන් ම ජීවිතයට පැමිණි නොයෙක් බාධක කම්කටොලුවලට සෘජුව මුහුණදීමට නිබඳ ව අප ගත සිත ශක්තිමත් කරන ශ්‍රියානි කෝට්ටගොඩ අපගේ ආදරණීය මෑණියන් ද සිහිපත් කරනුයේ මහත් සෙනෙහසිනි.

මෙම පර්යේෂණ කාර්යය ආරම්භ කළ දිනයේ සිට ම මේ දක්වා ම අපගේ උපදේශකවරයාණන් ලෙස ක්‍රියා කරමින් පිතෘ ස්නේහයෙන් නිබඳ ව අප මෙහෙයවූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ වත්මන් අංශාධිපති ආචාර්ය ඩබ්ලිව්. බී. ඒ. විතාරණ විද්වතාණන් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරමු.

පර්යේෂණ කාර්යය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි ඒකකයේ ලියාපදිංචි වූ දින සිට මෙම පර්යේෂණයේ බාහිර උපදේශකවරයා වූ විශ්‍රාමික මහාචාර්ය ආනන්ද ගුණසිංහ සූරීන්ට ද බෙහෙවින් ස්තුතිවන්ත වෙමු. එමෙන් ම පර්යේෂණ කාර්යය ආරම්භක අවධියේ සිට හමු වන සෑම විට ම අප දිරිමත් කරවූ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ ගුරු පියාණන් ද භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ගුරු පියාණන් ද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝරි මනම්පේරි ගුරු මෑණියන් ද, ආචාර්ය හිමාලිකා රණවීර හා ආචාර්ය දීපාල් ගුණසේන සහෘදයින් ද සිහිපත් කරමු.

මෙම පර්යේෂණ කාර්යයේ නියැලීමට අවශ්‍ය අධ්‍යයන නිවාඩු ලබාදෙමින් අප දිරිමත් කළ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වත්මන් උපකුලපති ජ්‍යෂ්ඨ මහාචාර්ය සරත් චන්ද්‍රජීව මහතාට ද, නර්තන හා නාට්‍ය කලා පීඨයේ පීඨාධිපති ජ්‍යෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතාට ද අප අධ්‍යයනාංශයේ වත්මන් අංශප්‍රධාන ජ්‍යෂ්ඨ කථිකාචාර්ය මහින්ද විමලසිරි මහතාට ද බෙහෙවින් ස්තූති වන්ත වෙමු.

පශ්චාද් උපාධි පර්යේෂණ කටයුතුවල දී මෙන් ම අපගේ ජීවිතයේ නොයෙක් අභියෝගාත්මක අවස්ථාවන්හි දී නිබඳ ව අප සිත ශක්තිමත් කරමින් උපදෙස් ලබාදෙන කැලණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු ගුරු පියාණන් හා සම්මානිත මහාචාර්ය ලයනල් බෙන්තරගේ ගුරු පියාණන් ද සිහිපත් කරනුයේ හද පිරි සෙනෙහසිනි. එමෙන් ම පර්යේෂණ කාර්යයන් සඳහා නිතර ම අප දිරිමත් කරවන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ආචාර්ය අසෝකා දිසානායක, ආචාර්ය පාලිකා සමන්ති, ආචාර්ය ගයානි දීපිකා මද්දුමාගේ, මහාචාර්ය ශ්‍රියාණි රාජපක්ෂ සහ ජ්‍යෂ්ඨ කථිකාචාර්ය අනුර ශාන්තකුමාර යන ගුරු භවතුන් ද ගෞරවයෙන් සිහිපත් කරමු.

මෙම පර්යේෂණ කාර්යය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී අප වෙත නන් අයුරින් උපකාර කළ අය බොහෝ වෙති. එහිලා, දෙවුන්දර පරමවිචිත්‍රාරාම රජමහා විහාරයේ විහාරාධිපති අතිපූජ්‍ය සිරිසුනන්ද නාහිමියන් සිහිපත් කරනුයේ ගෞරවාන්විත භක්ත්‍යාදරයෙනි. එමෙන් ම දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලයේ ප්‍රධාන කපු ධුරන්දර රාමක්‍රිෂ්ණ තේනබඳු මහතා ද බස්නායක නිලමේ කුනම හැන්නැදිගේ නන්දසිරි මහතා ද, දෙවුන්දර ප්‍රාදේශීය සභාවේ උපනගරාධිපති අපගේ සහෝදර ජගත් පද්මතිලක මහතා ද සිහිපත් කරනුයේ හද පිරි සෙනෙහසිනි.

මෙම නිබන්ධය සැකසීමේ දී සම්මුඛ සාකච්ඡා සපයාදීමෙන් හා දුර්ලභ අත් පිටපත් ලබාගැනීමට සහය වීමෙන් උපකාර කළ අය බොහෝ ය. ඒ අතර ප්‍රවීණ නර්තන ශිල්පීන් ද පරිවාර දේවාලය කපු මහතුන් මෙන් ම අප හිතවත් හර්ෂ වික්‍රමතුංග, සුසන්ත විදානගමගේ, ශෂාන් දෙමින්ද, අසංක කොඩිකාර යන හිතවතුන් ද මෙහි දී සිහිපත් කරමු.

පර්යේෂණ කාර්යයට අදාළ තොරතුරු අධ්‍යයනයේ දී ආහාර-පාන හා නවාතැන් ලබාදීම සම්බන්ධයෙන් දෙවුන්දර ප්‍රදේශයේ අපගේ ඥාති හිතවතුන් වන එල්. එච්. කල්‍යාණි ආදරණීය සුළු මෑණියන් ද රවීන්ද්‍ර පුෂ්පකුමාර, ගීතා නිහාරි සහ බිමල්කා තුෂාරි යන සහෝදර සහෝදරියන් ද දක්වන ලද සහයෝගයට බෙහෙවින් කෘතඥ වෙමු.

මෙම පර්යේෂණය ආරම්භයේ සිට ම අවසානය දක්වා ම පර්යේෂණගත කරුණු සම්බන්ධ ව නොයෙක් තර්ක ගොඩනගමින් අප නිතර ම දිරිමත් කරමින් ද නිබන්ධය පරිගණකගත කරමින් ද අනුපමේය කැපවීමක් කළ අප දයාබර බිරිය විශාරද ශ්‍යාමා නිශාන්ති මහත්මියත්, දෑස වන් ගගනි සෞන්දර්යා හා ජනානි තරානා යන දියණියනුත් ආදරයෙන් සිහිපත් කරමු.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පද්මලාල් මැතිතුමා සහ නියෝජ්‍ය ලේඛකාධිකාරී ඒ. එම්. ශ්‍රියංගනී මෙන්ඩිස් මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, නන් අයුරින් සහාය දැක්වූ භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ තාවකාලික සහකාර කථිකාචාර්ය සමීර චින්තක කුමාරසිංහ මහතාට සහ චොෂිකා දිල්රුක්ෂි මෙණෙවිය ඇතුළු අධ්‍යයනාංශ කාර්ය මණ්ඩලයටත් මෙහිලා ස්තුතිය පුද කර සිටිමු.

ජනක චමින්ද කෝට්ටගොඩ

පශ්චාද් උපාධි අපේක්ෂක

## පටුන

පර්යේෂක ප්‍රකාශය

උපදේශකවරයාගේ ප්‍රකාශය

උපකාරානුස්මෘතිය

පටුන I

වගු පටුන VIII

ඡායාරූප පටුන IX

සංක්ෂේපණය XIII

පර්යේෂණ සංක්ෂිප්තය XIV

**පළමුවන පරිච්ඡේදය**

**හැඳින්වීම**

1.1 මාතෘකාව හැඳින්වීම 01

1.2 අධ්‍යයන ගැටලුව 07

1.3 අධ්‍යයනයේ අරමුණු 07

1.4 අධ්‍යයනයේ වැදගත්කම 08

**දෙවන පරිච්ඡේදය**

**සාහිත්‍යික විමර්ශනය**

2.1 ශ්‍රී විෂ්ණු දෙවියන් පිළිබඳ ලියැවී ඇති ප්‍රාථමික මූලාශ්‍රය 09

2.2 දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය පිළිබඳ සංදේශ කාව්‍ය මඟින් 15

හෙළි වන තොරතුරු ඇතුළත් ප්‍රාථමික මූලාශ්‍රය

2.3 දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය පිළිබඳ ලියැවී ඇති ද්විතීයික මූලාශ්‍රය 23

2.4 සිංහල නර්තන කලාවෙන් හෙළිදරවු වන ශ්‍රී විෂ්ණු දේව ඇදහීම හා වන්දනය පිළිබඳ ද්විතීයික මූලාශ්‍රය 29

2.5 සාහිත්‍යික විමර්ශන සමාලෝචනය 32

**තෙවන පරිච්ඡේදය**

## පර්යේෂණ ක්‍රමවේදය

3.1 හැඳින්වීම 36

3.2 පර්යේෂණ ප්‍රවේශය 36

3.3 පර්යේෂණ පිරිසැලසුම 39

3.3.1 පර්යේෂණ අරමුණු

3.3.2 අධ්‍යයන ජනගහනය

3.3.3 සහභාගි වූ පිරිස

3.3.4 දත්ත රැස් කිරීමේ ක්‍රම

3.3.4.1 මූලාශ්‍රය අධ්‍යයනය

3.3.4.2 සහභාගිත්ව නිරීක්ෂණ සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය

3.3.4.3 සම්මුඛ සාකච්ඡා

3.3.4.4 ශ්‍රව්‍ය හා දෘශ්‍ය ප්‍රකාශන

3.3.5 දත්ත විශ්ලේෂණය කළ ක්‍රම

3.3.5.1 තේමා විශ්ලේෂණය

3.4 පර්යේෂණ සීමා 45

3.5 පර්යේෂණ ආචාර ධර්ම 45

**සිවුවන පරිච්ඡේදය**

**දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය**

4.1 ලක්දිව දේවාලය සංස්කෘතියේ ආරම්භය හා විකාසනය 46

4.1.1 ශ්‍රී ලංකාවේ ප්‍රාග් බෞද්ධ ජන ඇදහිලි හා විශ්වාස

4.1.2 ලක්දිව දේවාලය සංස්කෘතියේ ආරම්භය හා විකාසනය

4.1.3 මාතර දිස්ත්‍රික්කය හා දෙවිනුවර නගරයේ ඓතිහාසික පසුබිම හා විකාසනය

4.1.3.1 මාතර දිස්ත්‍රික්කය හැඳින්වීම

4.1.3.2 දෙවිනුවර නගරයේ ඓතිහාසික පසුබිම

4.1.3.3 දෙවිනුවර නගරයේ නාම ප්‍රභවය

4.1.4 දෙවිනුවර උපුල්වන් දේවාලය හෙවත් ශ්‍රී විෂ්ණු දේවාලයේ ආරම්භය හා විකාසනය.

4.2 උපුල්වන් හා විෂ්ණු දේව සංකල්පය 71

4.2.1 භාරතීය විෂ්ණු දේව සංකල්පය

4.2.2 ලක්දිව විෂ්ණු සංකල්පයේ විකාසනය

4.2.3 ලක්දිව උපුල්වන් සංකල්පයේ භාවිතය

4.2.4 විෂ්ණු දස අවතාර සංකල්පය සහ බුදුන් වහන්සේ ඊට ඇතුළත් කරගැනීම.

4.2.5 සිංහල නර්තන කලාවෙන් විද්‍යමාන විෂ්ණු දේව ඇදහීම

4.2.5.1 උඩරට නර්තනය

4.2.5.2 පහතරට නර්තනය

4.2.5.3 සබරගමු නර්තනය

4.2.6 විෂ්ණු දෙවියන් හා බැඳි පහතරට සින්දු වන්නම්

4.2.7 විෂ්ණු දෙවියන් පිළිබඳ මාතර ජනතාව අතර පවතින ජනශ්‍රැති,

විශ්වාස හා සංස්කෘතික ලක්ෂණ

4.2.8 දෙවිනුවර දේවාලය හා බැඳි විශ්වාස

4.3 දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ පරිපාලනය, චාරිත්‍ර-වාරිත්‍ර, 145

වත්-පිළිවෙත් සහ සංදේශ කාව්‍යවලින් නිරූපිත විෂ්ණු දේවාලය

4.3.1 දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ ඓතිහාසික පිහිටීම, පරිවාර දේවාලය සහ

හත්දෙවි සංකල්පය

4.3.1.1 සිංහාසනය

4.3.1.2 මහවත් මඬුව

4.3.1.3 සෙල්මුවා උළුවස්ස

4.3.1.4 ගල්ගණේ ගල්ගෙය

4.3.1.5 පරිවාර දේවාලය සහ හත්දෙවි සංකල්පය

4.3.1.6 කතරගම දේවාලය

4.3.1.7 වල්ලි අම්මා දේවාලය

4.3.1.8 අලුත් දෙවියන්ගේ දේවාලය

4.3.1.9 බස්නාහිර දෙවි දේවාලය

4.3.1.10 සමන් දෙවි දේවාලය

4.3.1.11 පත්තිනි දේවාලය

4.3.1.12 ගණදෙවි දේවාලය

**4.3.2** ශ්‍රී විෂ්ණු දේවාලයේ පරිපාලනය හා කාර්ය සංවිධානය

4.3.2.1 ඇතුළු කට්ටල් නිලකාරයෝ

4.3.2.2 කපුරාල/නායක පූජක

4.3.2.3 කාරියකරන රාල /ගබඩා රාල

4.3.2.4 වට්ටෝරු රාල

4.3.2.5 මොහොට්ටාල/මොහොට්ටි රාල

4.3.2.6 කත්තියන රාල

4.3.2.7 මුළුතැන් රාල/මුරුතැන් රාල

4.3.2.8 ආලත්ති අම්මා

4.3.2.9 පිට කට්ටලේ  නිලකාරයෝ

4.3.2.10 බස්නායක නිලමේ

4.3.2.11 වන්නකු රාල

4.3.2.12 ගජනායක නිලමේ

4.3.2.13 ආරච්චි රාලවරු

4.3.2.14 පලිහනේ රාලවරු

4.3.2.15 විදානේ රාලවරු

4.3.2.16 මුතුකුඩේ රාල

4.3.3 ශ්‍රී විෂ්ණු දේවාලයේ චාරිත්‍ර-වාරිත්‍ර, වත්-පිළිවෙත් හා සමාජ සබඳතා

4.3.3.1 අලියඳුරේ

4.3.3.2 හම්බා කෙටීම

4.3.3.3 මුරුතැන් බෑම

4.3.3.4 සතියේ කෙම්මුර දින පූජාව

4.3.3.5 වාර්ෂික ඇසළ පූජාව

4.3.3.6 මල්-පහන්, සුවඳ දුම් පූජාව

4.3.3.7 පලතුරු පූජාව

4.3.3.8 භෝජන පූජාව

4.3.3.9 පංචෝපහාර පූජාව

4.3.3.10 විෂ්ණු දෙවියන් වෙනුවෙන් පහන් තැබීම

4.3.3.11 විෂ්ණු දෙවියන් වෙනුවෙන් පඬුරු බැඳීම

4.3.4 සන්දේශ කාව්‍යවලින් හෙළි වන දෙවිනුවර විෂ්ණු දේවාලය පුද බිම

4.3.4.1 මයූර සන්දේශය

4.3.4.2 තිසර සන්දේශය

4.3.4.3 පරෙවි සන්දේශය

4.3.4.4 කෝකිල සන්දේශය

4.3.4.5 සැළලිහිණි සන්දේශය

4.3.4.6 ගිරා සන්දේශය

4.3.4.7 හංස සන්දේශය

4.3.4.8 නීලකොබෝ සංදේශය

4.4 දෙවිනුවර ඇසළ පෙරහර මංගල්‍යය 214

4.4.1 ශ්‍රී ලාංකේය පෙරහර සංස්කෘතියේ ඉතිහාසය

4.4.2 ඇසළ පෙරහරේ ඓතිහාසික පසුබිම

4.4.3 දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ ඇසළ පෙරහර

4.4.4 ඇසළ මංගල්‍යයේ කප් සිටුවීම හා බැඳි චාරිත්‍ර-වාරිත්‍ර

4.4.5 පේලි පෙරහර, මහ පෙරහර භාරකාරත්වය සහ නව ප්‍රවණතා

4.4.6 දෙවිනුවර රජමහා විහාරය සහ ඇසළ පෙරහරේ බෞද්ධ මුහුණුවර

4.5 දෙවිනුවර කෝල්මුර යාගය සහ දේව දානය 238

4.5.1 පත්තිනි දේව ඇදහිල්ලේ විකාසනය

4.5.2 දෙවිනුවර කෝල්මුර යාගය

4.5.3 කෝල්මුර යාග චාරිත්‍ර-වාරිත්‍ර සහ වත්-පිළිවෙත්

4.5.3.1 පූර්ව චාරිත්‍ර

4.5.3.2 යාග දින චාරිත්‍ර සහ පූජා විධි රටාව

4.5.3.3 යාගයට පසු දින චාරිත්‍ර

4.5.3.4 කෝල්මුර යාගයේ සැරසිලි

4.5.4 දෙවිනුවර මහා දේව දානය

**පස්වන පරිච්ඡේදය**

**සමාලෝචනය** 261

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

උපග්‍රන්ථය

# වගු පටුන


| වගු සටහන | | පිටු අංකය |
|---|---|---|
| 1) ශ්‍රී ලාංකේය බෞද්ධ සමාජයේ සර්ව දේව මණ්ඩලය | - | 04 |
| 2) විෂ්ණු හා උපුල්වන් සමාන හා අසමානතා ලක්ෂණ | - | 06 |
| 3) පර්යේෂණ සැලැස්ම (දත්ත රැස් කිරීමේ ක්‍රම) | - | 42 |
| 4) ශ්‍රී ලංකාවේ දේවාලය ආරම්භය - අනුපිළිවෙළ | - | 51 |
| 5) විෂ්ණු හා උපුල්වන් යනු දෙදෙනකු බවට හඳුනාගත් අනන්‍යතා ලක්ෂණ | - | 87 |
| 6) ශ්‍රී විෂ්ණු දේවාලයේ ඇතුළු කට්ටලේ කාර්ය සංවිධානය | - | 156 |
| 7) ශ්‍රී විෂ්ණු දේවාලයේ පිට කට්ටලේ කාර්ය සංවිධානය | - | 161 |
| 8) සිංහල සන්දේශ කාව්‍යයන්හි සාරාංශගත සටහන. | - | 175 |
| 9) සත් පත්තිනි හා දොළොස් පත්තිනි නාම ලේඛනය | - | 240 |

## ඡායාරූප පටුන


| ඡායාරූප අංකය හා විස්තරය | අදාළ පිටු අංකය |
| --- | --- |
| 1) මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර පළාත් පාලන කොට්ඨාස සිතියම | 56 |
| 2) ක්‍රි. ව. 140 දී පමණ ක්ලෝඩියස් ටොලමි නිර්මාණය කළ ඉපැරැණි ම ලෝක සිතියම. | 56 |
| 3) ග්‍රීක ජාතික ක්ලෝඩියස් ටොලමි | 56 |
| 4) දෙවිනුවර සුදුගල පිහිටියේ යැයි සැළකෙන මුහුදු ප්‍රදේශය | 59 |
| 5) දෙවිනුවර දේවාලය පරිශ්‍රයේ සිටුවා ඇති ගල් කණුවක රාම කුමරු විසින් රාවණ රජු හට විදීමට දුනුදිය මෙහෙයවන ආකාරය දැක්වෙන ශෛලමය රූප සටහන් සහ රාවණ රජුගේ ශෛලමය රූප සටහන | 62 |
| 6) ඓතිහාසික ශිව දේවාලය යැයි සැලකෙන ගල්ගෙය | 63 |
| 7) අලුත්ගම කන්දේ විහාරයේ කෞතුගාරයේ පිහිටුවා ඇති බුදුන් විසින් ලංකාරක්ෂාව උපුල්වන් දෙවියන්ට පවරන ලද අවස්ථාව දැක්වෙන මූර්තිමය රූප සටහන | 65 |
| 8) අලුත්ගම කන්දේ විහාරයේ ශ්‍රී විෂ්ණු දෙවියන්ගේ ඡායාරූපය | 65 |
| 9) දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලය සත්මහල් ප්‍රාසාදයක් ලෙස පැවැති බවට සැලකෙන ඉපැරැණි රූප සටහන | 69 |

10) පෘතුගීසීන් විසින් සත්මහල් උපුල්වන් දේවාලය බිඳදමා විනාශ කිරීමෙන් 70
කලකට පසුව බ්‍රාහ්මණ පූජකයකු විසින් මෙහි විෂ්ණු දේව ප්‍රතිමාවක්
තැන්පත් කර කුඩා කුටියක් ඉදි කරගෙන පුද-පූජා පවත්වන ලද
ඉපැරැණි දේවාලයේ ඡායාරූපය

11) දෙවන රාජසිංහ රජු විසින් ඉදි කරවන ලද ශ්‍රී විෂ්ණු දේවාලයේ ශේෂ ව 70
දක්නට ලැබෙන ඓතිහාසික නටබුන්

12) වර්තමානයේ මහල් තුනකින් සමන්විත දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය සහ 70
ශ්‍රී විෂ්ණු දේවාලයේ පිහිටුවා ඇති ශ්‍රී විෂ්ණු දෙවියන්ගේ මූර්තිය

13) ශ්‍රී විෂ්ණු දෙවියන්ගේ ඡායාරූපය 87

14) ඓතිහාසික දඹුල්ල ලෙන් විහාරයේ දක්නට ලැබෙන 87
උපුල්වන් දෙවියන්ගේ ඡායාරූපය.

15) ශ්‍රී විෂ්ණු දස අවතාරය 93

16) ශ්‍රී විෂ්ණු මත්ස්‍ය අවතාරය 94

17) ශ්‍රී විෂ්ණු කූර්මාවතාරය 95

18) ශ්‍රී විෂ්ණු වරාහ අවතාරය 98

19) ශ්‍රී විෂ්ණු නරසිංහ අවතාරය 99

20) ශ්‍රී විෂ්ණු වාමන අවතාරය 100

21) ශ්‍රී විෂ්ණු පරශුරාම අවතාරය 101

22) ශ්‍රී විෂ්ණු රාමාවතාරය 103

23) ශ්‍රී විෂ්ණු කෘෂ්ණ අවතාරය 104

24) ශ්‍රී විෂ්ණු බුද්ධාවතාරය 106

25) ශ්‍රී විෂ්ණු කල්කින් අවතාරය 107

26) පහතරට සූනියම් ශාන්තිකර්මයේ විෂ්ණු දෙවියන් වෙනුවෙන් දලුමුර කැප කිරීම හා විෂ්ණු මල් අස්න නර්තනය ඉදිරිපත් කැරෙන අවස්ථාව 119

27) දෙවිනුවර නගර සිතියම 134

28) කිහිරි කොටස පාවී ආ මඟුල්වැල්ල වෙරළ තීරය 134

29) වාර්ෂික ඇසළ උත්සවය අවසානයේ දෙනු ලබන මහා දේව දානය සඳහා පූජා ද්‍රව්‍ය එකතු කිරීම 141

30) සිංහාසනය පවතින දේවාලය රූප සටහන සහ සිංහාසනය පවතින දේවාලය ඇතුළත 146

31) මහවත් මඬුවේ නෂ්ටාවශිෂ්ට වී ඇති කොටස් දැක්වෙන රූප සටහන 147

32) හඳගල ගාව ස්ථානය 147

33) සෙල්මුවා උළුවස්ස 149

34) පුරාවිද්‍යා කැනීම්වල දී ගල්ගණේ ගල්ගෙය ස්ථානයෙන් හමු වූ "කොකුරිදී " නමින් හැඳින්වෙන පැරැණි රිදී කාසි 150

35) ගල්ගණේ ගල්ගෙය 151

36) දෙවිනුවර පරිවාර දේවාලය හත 152

37) දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ කපු නායක පූජකවරු 158

38) දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ බස්නායක නිලමේවරු 162

39) ඇසළ මංගල්‍යයේ කප් සිටුවීම 224

40) දෙවිනුවර 103 වන මයිල කණුව 228

41) මාතර දිසාවේ කොඩිය 228

42) දෙවිනුවර ඇසළ පෙරහරේ විශේෂ අවස්ථා 229

43) දෙවිනුවර රජමහා විහාරය. 233

44) දෙවිනුවර සිරිසුනන්ද නාහිමි 234

45) ඓතිහාසික ශෛලමය වෘෂභ මූර්තිය 234

46) සඳකඩ පහණ 235

47) දෙවිනුවර කෝල්මුර යාගයේ චාරිත්‍ර විධි 247

48) කෝල්මුර යාගයේ ප්‍රධාන තොරණ 258

49) දෙවිනුවර මහා දේව දානය 259

50) දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය සහ රජමහ විහාරයේ පිහිටුවා ඇති 235
විශේෂ ඓතිහාසික ස්ථාන හා නටබුන්

## සංක්ෂේපණය

| | | |
|---|---|---|
| වි. පු. | - | විෂ්ණු පුරාණය |
| භා. පු. | - | භාගවත පුරාණය |
| ග. පු. | - | ගරුඩ පුරාණය |
| පැ. සි. | - | පැරකුම්බා සිරිත |
| ම. ව. | - | මහාවංසය |
| ද. සි. | - | දළදා සිරිත |
| ති. සං. | - | තිසර සන්දේශය |
| ම. සං. | - | මයූර සන්දේශය |
| ප. සං. | - | පරෙවි සන්දේශය |
| කෝ. සං. | - | කෝකිල සන්දේශය |
| පැ. දෙ. | - | පැරණි දෙවිනුවර |
| දෙ. ඉ. | - | දෙවුන්දර ඉතිහාසය |
| අ. ඉ. | - | අසිරිමත් ඉන්දියාව |
| බු. ස. ජ. | - | බුදු සමයෙන් සැකසුණු ජන ඇදහිලි |
| මා. පු. ඉ. | - | මාතර පුරාවිද්‍යාත්මක ඉතිහාසය |
| දේ. සං. | - | දේව සංකල්පය |
| දේ. උ. | - | දේවාල උපත |
| මා. ව. | - | මාතර වංශය |
| ල. පු. | - | ලක්දිව පුරාණය |
| සූ. ශා. | - | සූනියම් ශාන්තිය |
| ප. ශා. සා. | - | පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය |
| සි. ව. වි. | - | සින්දු වන්නම් විමර්ශනය |

**දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය ආශ්‍රිත පුද සිරිත් සහ සමාජය**

**ජනක චමින්ද කෝට්ටගොඩ**

## පර්යේෂණ සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ උපුල්වන් දෙවියන් හෙවත් විෂ්ණු දෙවියන් උදෙසා තනවා ඇති ප්‍රධානතම දේවාලය දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලය යි. ශ්‍රී ලාංකේය බෞද්ධ ජන සමාජයේ ලංකා පාලක සතරවරම් දෙවිවරුන් අතුරින් ශ්‍රී විෂ්ණු දෙවි ප්‍රධාන වේ. මෙම පර්යේෂණයේ අරමුණ දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලයේ ඓතිහාසිකමය ස්වරූපය, පුරාවිද්‍යාත්මක වටිනාකම, ශ්‍රී විෂ්ණු දේව සංකල්පය හා උපුල්වන් දෙවියන් සම්බන්ධයෙන් ගොඩනැගී ඇති මතවාද හා ජනශ්‍රැති පිළිබඳ විමර්ශනය කිරීම යි.

මෙහි දී තද් දේවාලය හා සම්බන්ධ දෛනික, සතිපතා සහ වාර්ෂික වශයෙන් සිදු කරනු ලබන චාරිත්‍ර-වාරිත්‍ර, වත්-පිළිවෙත් පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයන කරමින් පර්යේෂණ ගැටලු සඳහා අවශ්‍ය දත්ත හා මූලාශ්‍රය ගවේෂණය කරන ලදි. ශ්‍රී විෂ්ණු දෙවියන් කෙරෙහි දෙවුන්දර ජන සමාජයේ පවතින විශ්වාස පදනම් කරගනිමින් දේවාලයේ වාර්ෂික චාරිත්‍ර-වාරිත්‍ර කෙරෙහි මෙහි දී වැඩි අවධානයක් යොමු කැරිණ.

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ විධි ක්‍රමය භාවිත කරන ලදි. එහි දී ලිඛිත මූලාශ්‍රය සඳහා විෂ්ණු දේව සංකල්පය හා සම්බන්ධ ශ්‍රී ලාංකේය වංසකථා, පුරාණ කථා හා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ ද අලිඛිත මූලාශ්‍රය යටතේ දෙවුන්දර දේවාලයේ වාර්ෂික චාරිත්‍ර-චාරිත්‍ර හා වත්-පිළිවෙත් පැවැත්වෙන අවස්ථාවල දී සහභාගිත්ව නිරීක්ෂණය කර ලබාගත් ඡායාරූප, හඬ පට, වීඩියෝ පට, ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා ආදිය ද මගින් තොරතුරු හා දත්ත ලබාගැනීමට හැකි විය. මෙම මූලාශ්‍රය ද්විත්වය මගින් දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය පිළිබඳ ඓතිහාසික හා සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත.

ශ්‍රී විෂ්ණු දේව සංකල්පය බුදුදහමේ ආරක්ෂාවට පත් සර්වකාලීන දෙවි කෙනකු ලෙස හඳුනාගැනීමට හැකි විය. ශ්‍රී විෂ්ණු දෙවියන්ගේ නාමය සන්දේශ කාව්‍යයන්හි දී වරෙක උපුල්වන් ලෙස ද තවත් තැනෙක විෂ්ණු ලෙස ද හඳුන්වා ඇති බව ප්‍රත්‍යක්ෂ විය.

එමෙන් ම ශ්‍රී විෂ්ණු දේව සංකල්පය ශ්‍රී ලාංකේය ජන සමාජයේ විශේෂ ගෞරවයට ලක් වන ආකාරය මෙම දේවාලය හා සම්බන්ධ චාරිත්‍ර-වාරිත්‍ර, ඇදහිලි හා වත්-පිළිවෙත් මඟින් හෙළිදරවු වන බව පර්යේෂණාත්මක ව අනාවරණය කරගැනීමට හැකි විය.

ප්‍රමුඛ පද :- උපුල්වන්, දේවාලය, සමාජය